# සිංහලෙන් බ්ලොග් ලියමු ද?

**රසික සූරියආරච්චි විසිනි**

කවි, කෙටිකතා හෝ වෙනත් ආකාරයක නිර්මාණකරණයේ යෙදෙන බොහෝ දෙනෙකු ගේ මූලික අවශ්‍යතාවක් වනුයේ ඒ නිර්මාණ අන් අය සමග බෙදා ගැනීමයි. එසේත් නැතිනම්, තමන් ලියූ දේ අනුන් කියවා රස විඳිනු දැකීමයි.

විවිධ සමාජ දේශපාලන කරුණු පිළිබඳව තම අදහස් අකුරු බවට පෙරළා සටහන් කරන්නන් ගේ ද මූලික අවශ්‍යතාවය වනුයේ, ඒ අදහස් හැකිතාක් වැඩි පිරිසකගේ නෙත ගැටී කියවීමට සැලැස්වීමයි. එමගින් යම් කිසි ආකාරයක සංවාදයක් ඇරඹීමයි.

මේ සඳහා කාලයක් තිස්සේ අප සතුව තිබුණු ප්‍රකාශන මාධ්‍යය වූයේ සඟරා පුවත්පත් යනාදියේ කවි කෙටිකතා අතිරේක මෙන්ම, කතෘට ලියුම් හෝ වෙනත් විශේෂාංශ සඳහා වෙන් කර ඇති ඉඩයි.

නමුත්, තම නිර්මාණ අන් අය සමග බෙදා ගැනීමට නිර්මාණකරුවන් තුළ ඇති අවශ්‍යතාවය ද, තම අදහස් පාඨකයින් වෙත සම්ප්‍රේෂණය කිරීමට ලේඛකයින් තුළ ඇති අවශ්‍යතාවය ද එලෙසම නොවෙනස්ව නොසිඳී පවතී.

එසේම, සඟරාවක උප කතුවරයෙකුගේ තේරීම්වලට කොටු වී ඉන් සෑහීමකට පත්වීම නොව, රසිකයින් වශයෙන්, තමන් කැමති වීමට ඉඩ ඇති සියලු නිර්මාණ සහ අනෙකුත් ලිපි ලේඛන දැක ඇගයීමට පාඨකයින්ට ඇති අවශ්‍යතාව ද එලෙසම ය.
මේ අවශ්‍යතා ද්වය එකිනෙක ගැටී එකිනෙක සංතර්පණය කෙරෙන අවකාශය, බ්ලොග් නමින් අප හඳුන්වන ප්‍රකාශන මාධ්‍යය වේ යැයි මම සිතමි.
බ්ලොග් (ඉකදට) යන වචනය සෑදී ඇත්තේ වෙබ් (ජාලය) සහ ලොග් (සටහන) යන වචනද්වයේ එකතුවෙනි. සිංහලෙන් ජාලසටහන් ලෙස හැඳින්විය හැකි බ්ලොග් යනු මූලිකවම අන්තර්ජාලය හරහා මුදා හැරෙන පුද්ගලික ප්‍රකාශන මාධ්‍යයකි. අප අපේ නිර්මාණ සහ වෙනත් ලියවිලි පොතක සටහන් කරන්නාක් සේ ඒවා ඉලෙක්ට්‍රොනික ක්‍රමයට සටහන් කර අන්තර්ජාලයේ ප්‍රකාශනය කර පාඨකයින් හා බෙදා ගැනීමකි.




එවැනි නිර්මාණයක් හෝ ලිපියක් පුවත්පතක, සඟරාවක පළවී ඒ ගැන පාඨක ප්‍රතිචාරයක් අසන්නට ලැබීම යනු රචකයෙකුට ඉතා වටිනා වින්දනයක් බව දන්නෝ දනිති. ලේඛකයින්, නිර්මාණකරුවන් තම ලියවිලි පුවත්පත්වලට යොමු කරන්නේ අනිවාර්යෙන් ම ඒ නිසාය.
කොටින්ම, තුන්වෙනි ශ්‍රේණියේ දී මා මුහුදු වෙරළ නමින් කුඩා කවියක් ලියූ සැනින්ම මට සිතුණේ එය මිහිර පත්තරයට තැපැල් කරන්නටයි. අම්මා, තාත්තා, වෙනත් ඥාතියෙකු, හේමවතී ටීචර් හෝ පන්තියේ සිසුවෙකු ඒ කවිය කියවන්නට පෙර එය දුටුවේ ලේක් හවුසියේ සේවය කළ පත්තරකාරයෙකි. ඒ කවිය මිහිර පත්‍රයේ පළවී තිබෙනු දැකීම මට ගෙන දුන්නේ ඉමහත් සතුටකි.

පසු කලෙක, වයස දසයයි මාසයේ දී, ගනේමුල්ලමරදන කෝච්චි ගමන් අතරතුර පහළ වුණු කවි සිතුවිලි අකුරු වී යොවුන් ජනතා නම් සඟරාමය සතිපතා පුවත් පතට විටින් විට යොමු විය. කුඩා කළ මා ලියූ මුල් කවියම මිහිර පත්තරේ පළවීම ලොතරැයි දිනුමක් ඇදීමක් තරමේ අති දුර්ලභ සිදුවීමක් බව මට වැටහුණේ යොවුන් ජනතා සඟරාවට යොමු කළ කවි නිසාය.

තුන් වසරක පමණ කාලයක් තිස්සේ මා ලියූ කවි සිය ගණන අතුරින් තෝරා ගත් විසි පහක් පමණ විටින් විට යොවුන් ජනතාවට යොමු කළ ද, එහි පල වුණේ පහක් හෝ හයක් පමණි.

මේ ආකාරයට තම නිර්මාණ සිතූ ආකාරයට පුවත්පත්, සඟරාදියෙහි පළ කරවා ගැනීමට නොහැකිවීම, මට පමණක්, එදා පමණක් සිදුවූ දෙයක් හෝ සිදුවෙන්නක් හෝ නොවේ. සීමිත සම්පතක් වන පුවත්පත් සඟරා පිටුවක වපසරිය කතුවරුන් විසින් භාවිතා කරන්නේ උපරිම ඵලදායීතාවය ලබා ගැනීමට නිසා, ලේඛකයින් ගේ ප්‍රකාශන බලාපොරොත්තු ඒ ආකාරයටම ඉටු නොවීම යනු කිසිසේත් ම පුදුමයක් නොවේ.

බ්ලොග් අවකාශයේ දී, රචකයින් වශයෙන් අපට, යම් යම් මූලික සරල සීමාවන්ට පමණක් යටත්ව, අප රිසි දෙයක්, අප රිසි පරිදි ලියා ප්‍රකාශයට පත් කළ හැකිය.

එසේම, බ්ලොග් අවකාශයේ දී, පාඨකයින් වශයෙන් අපට, අප කැමති දෙයක්, කැමති ආකාරයකට කියවා රස විඳිය හැකිය.

රචකයින් ගේ ලේඛන කෞශල්‍යය පාඨකයින් ගේ රසිකත්වය හා ගලපන්නට අතරමැදි පුවත්පත්, සඟරා සංස්කාරකවරුන් බ්ලොග් අවකාශයේ නැත. පුද්ගලික ප්‍රකාශන මාධ්‍යයක් ලෙස බ්ලොග් අවකාශයේ ඇති වැදගත්කම එයම බවට වෙනත් තර්ක අවශ්‍ය නොවේ.

නිර්මාණකරුවෙකු හෝ ලේඛකයෙකු ලෙස ඔබ ලියන දේ බ්ලොගයක් හරහා ප්‍රකාශනය කිරීමෙන් ඔබට ලැබෙන තවත් එක් වාසියක් වනුයේ, ඒ නිර්මාණ හෝ සටහන් කිසිවෙකු හෝ කියවූවාද යන්න දැන ගැනීමටත්, එසේ කියවන පාඨකයින්ට ඔබට කරන්නට අවශ්‍ය ප්‍රතිචාරයක් වෙතොත් ඒවා ක්ෂණයකින් දැන ගැනීමටත් ඉඩ ලැබීමයි.

අන්තර්ජාලය යනු දේශ සීමා අදාළ නොමැති මාධ්‍යක් නිසා, එවැනි ප්‍රතිචාර ලෝකයේ ඕනෑම කෙළවරකින් ලැබීමට ශක්‍යතාවය ඇත. සීමිත පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය වී සීමිත භූගෝලීය ප්‍රදේශයක බෙදා හැරෙන පුවත්පත් හෝ සඟරා ගැන සලකන විට මේ අතින් ප්‍රකාශන මාධ්‍යයක් ලෙස බ්ලොග් ලිවීම ඇත්තේ ගව් ගණනක් ඉදිරියෙන් බව පෙනේ.

එසේම, මුද්‍රිත පුවත්පත් හෝ සඟරා පිටපත් බොහොමයක් කෙටි කලකින්ම බත් මුල් එතී කසළ ගොඩටද, නැතිනම් කෙළින්ම ප්‍රතිචක්‍රීකරනයට යොමු වෙතත්, ඉලෙක්ට්‍රොනික මාධ්‍යයේ බ්ලොග් පිටු සදහරිතව සැමදා පවතිනු ඇත.

## රසික සූරියආරච්චි - පුරෝගාමී සිංහල බ්ලොග්කරුවා සම්මානයට පාත්‍රවෙයි

**රසික සූරියයආරච්චි සිංහල බ්ලොග් රචකයන් අතර පුරෝගාමී සේවයක් කළ බ්ලොග්කරුවකු ලෙස හැඳින්වීම නිවැරදිය. සිංහල බ්ලොග් අඩවි සයිබර් අවකාශයට ආගන්තුක වූ සමයක සිංහල බ්ලොග්කරණයට එළැඹෙන රසික සිංහල බ්ලොග් ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා කරන ලද සේවය අගයනු වස් පසුගියදා පැවති නෙලුම්යාය බ්ලොග් සම්මාන උළෙලේ දී පුරෝගාමී සිංහල බ්ලොග්කරු ලෙස කතානායක කරු ජයසූරිය මහතා අතින් සම්මානයට පාත්‍රවන්නේ නාලක ගුණවර්ධන සමගින් ය. සිංහල බ්ලොග් ක්ෂේත්‍රයේ මහත් ගෞරවයට පාත්‍රව සිටින රසික සූරියආරච්චි සොහොයුරාට සන්නසේ සුබපැතුම්ද එක්වෙයි.**



අද වන විට සිංහල භාෂාවෙන් බ්ලොග් ලියන්නන් ද සිය ගණනක් ලොව පුරා විහිදී සිටිති. ඔවුන් විසින් දිනපතා කවි, කෙටිකතා, නවකතා, කතන්දර, වෙනත් නිර්මාණ, සමාජ දේශපාලන කරුණු සම්බන්ධයෙන් ලියවුණු ලිපි යනාදී ලේඛන අන්තර්ජාලයට මුදා හැරේ. එසේම, නිතිපතා මේ සිංහල බ්ලොග් කියවන්නන්ද, කියවා ප්‍රතිචාර දක්වන්නන්ද අති විශාල සංඛ්‍යාවක් ලොව පුරා සිටිති.

ඔබේ ගද්‍ය, පද්‍ය නිර්මාණ හෝ වෙනත් ලිපි ලේඛන මේ බ්ලොග් මාධ්‍යය හරහා පාඨකයින් වෙත යොමු කරන්නට ඔබ අවශ්‍ය නම් ඒ සඳහා උවමනා වන්නේ අඩු කාලයක්, අඩු මුදලක් සහ අඩු තාක්ෂක දැනුමක් පමණක් වීමද විශේෂයකි. අවුරුදු අටේ ළමයින් ගේ පටන් අවුරුදු අසූවේ වැඩිහිටියා දක්වා බ්ලොග්කරුවන් සිටින්නේ ඒ නිසාය.

බ්ලොගයක් ඇරඹීමට අවශ්‍ය අයෙකුට ඒ සඳහා භාවිතා කළ හැකි ප්‍රධාන සේවා සපයන සමාගම් දෙකකි. ඉන් ප්‍රධානතම සේවාව වන්නේ ගූගල් සමාගමට අනුබද්ධ බ්ලොගර් (ඉකදටටැරගජදප) සේවාවයි. ඊට අමතරව වර්ඩ්ප්‍රෙස් (අදරාචරැගජදප) සේවාවද ජනප්‍රිය වී ඇත. මේ සේවා දෙකෙන් කුමක් භාවිතා කිරීම සඳහා වූවද ඔබට අවශ්‍ය වන්නේ අන්තර්ජාල සම්බන්ධතාවක් සහ තරමක ඉංගිරිසි දැනුමක් පමණකි.
ඔබේ නිර්මාණ ලියවෙන්නේ සිංහල භාෂාවෙන් නම්, සාමාන්‍ය පරිගණක යතුරු පුවරුව භාවිතයෙන් සිංහලෙන් ටයිප් කිරීමට තරමක අත්දැකීමක් ලබා ගැනීමද වැදගත් වේ. මේ කටයුත්ත ඉතා පහසුවෙන් කර ගැනීමට ඉඩ සලසන නොමිලේ සැපයෙන ගූගල් ඉන්පුට් ටූල්ස් ( අඅඅගටදදටකැගජදපරැසබචමඑඑදදකිරැඑරහරැ ) වැනි අන්තර්ජාල සේවාවන් ද ඇත.

අවසාන වශයෙන්, බ්ලොගයක් ලිවීම හෝ සිංහලෙන් පරිගණක අකුරු ලිවීම පිළිබඳව වැඩි විස්තර හෝ උපදෙසක් ලබා ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා උපකාර කිරීමට මට හැකි බව සතුටින් දන්වමි.

රසික සූරියආරච්චි
rasika.suriyaarachchi@gmail.com

අති දක්ෂ කැරවෑන් සාදන්නෙක් අවශ්‍යයි
කැරවෑන් සැලසුම් මොඩල් සහ  සෑදීම පිළිබඳ
මනා දැනුමක් පළපුරුද්දක් ඇති අය කරුණාකර

අමතන්න
**සමන් 0490 104 398**